# සාරාංශය


එළඹෙන අභියෝගවලට මුහුණ දීමේ ශක්තිය ඇති පූර්ණ පෞරුෂයකින් හෙබි පුරවැසියන් දැයට දායාද කිරීමේදී පංති කාමර අධ්‍යාපනය මෙන්ම විෂය සමගාමී ක්‍රියාකාරකම් ද සෑප්‍රුවම ඉවහල් වේ. සිසුන් විෂය සමගාමී ක්‍රියාකාරකම් හා විෂය සාධනය සමබරව පවත්වා ගැනීමට උත්සාහ ගත යුතුය. විෂය සමගාමී ක්‍රියාකාරකම් වල නිරත උසස්පෙළ සිසුන් හට පාසල් පංති කාමරය තුළ රැඳී සිටමින් අතිශය සංකීර්ණ වූත්, තරංගකාරී වූත් උසස්පෙළ විෂය මාලාව හැදෑරිය යුතුය. ඒ අනුව අ.පො.ස. (උ.පෙළ) වාණිජ්‍ය විෂයධාරාව හදාරන විෂය සමගාමී ක්‍රියාකාරකම් වල නිරත වන සිසුන් විෂය සාධනය ලබාගන්නා ආකාරය පිළිබඳව විමසා බැලීම මෙහි අධ්‍යයන ගැටළුව ලෙස හඳුනාගෙන ඇත.

පරිච්ඡේද පහකින් සමන්විත මෙහි පළමු පරිච්ඡේදය යටතේ අධ්‍යයන ගැටළුව පිළිබඳ හැඳින්වීමක් කර ඇත. ඒ යටතේ අ.පො.ස. උසස්පෙළ වාණිජ්‍ය විෂයධාරාව හදාරන සිසුන් විෂය සමගාමී ක්‍රියාකාරකම් වල නිරතවන ආකාරය විස්තර කර ඇත. අධ්‍යයනය සඳහා පිහිටුවාගන්නා ලද අරමුණු, අදාල සංකල්පය හා නිර්වචන හැඳින්වීම හා අධ්‍යයනයේදී පිහිටුවා ගන්නා ලද සීමා මේ යටතේ විස්තර කර ඇත. අධ්‍යයනයේ අදාලත්වය හා ප්‍රායෝගික වැදගත්කම මෙම පරිච්ඡේදය අවසානයේ සැකෙවින් පැහැදිලි කර ඇත.

අදාළ සාහිත්‍ය විමර්ශනය දෙවන පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති අතර අධ්‍යයන ගැටළුව ආශ්‍රිත පර්යේෂණ හා වාර්තා පරිශීලනය කරමින් රැස්කල ඓතිහාසික තොරතුරු මේ යටතේ ගොනුකර ඇත. ගැටළුව වාණිජ්‍ය විෂයධාරාව හදාරන සිසුන් විෂය සමගාමී ක්‍රියාකාරකම්වල නිරත වන ආකාරය පිළබඳව බැවින් වාණිජ්‍ය විෂයධාරාව හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳව ඉදිරිපත් වී ඇති ඓතිහාසික තොරතුරු මේ යටතේ ගැඹුරින් විමර්ශනය කර ඇත. පංති කාමරය තුළ සිදුවන ගතානුගතික ශාස්ත්‍රිය විෂය මාලාව හා විෂය සමගාමී ක්‍රියාකාරකම් ආශ්‍රිත ඉගෙනුම පිළිබඳ විවිධ අර්ථ නිරූපන හා පාසල් විෂය මාලාවේදි විෂය සමගාමි ක්‍රියාකාරකම් සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව මේ යටතේ විමසා බැලිම සිදුකර ඇත.

තුන්වන පරිච්ඡේදය යටතේ අධ්‍යයන ක්‍රමවේදය හා පිළිබඳ සවිස්තරාත්මකව දක්වා ඇත.ජනගහනය හා නියැදය පිළිබදත් මේ යටතේ විස්තර වේ. අධ්‍යයනයේදි පාසල්, ගුරුවරු, සිසුන්, හා දෙමාපියන් යන විවිධ නියැදි වලින් දත්ත රැස් කර ගන්නා ලදි. දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස ප්‍රශ්නාලිය, ආකල්ප පරිමාණ පන්ති කාමර නිරක්ෂණ සම්මුඛ සාකච්ඡා යොදා ගන්නා ලදි. ඒ ඒ උපකරණ සකස් කළ ආකාරයද දත්ත රැස් කළ ආකාරය ආදි සියලුම තොරතුරු මෙම පරිච්ඡේදය යටතේ විස්තර කර ඇත.

හතරවන පරිච්ඡේදය යටතේ දත්ත ඉදිරිපත් කිරමේදී, විශ්ලේෂණය හා අර්ථකථනය සිදු කර ඇත. දත්ත ඉදිරිපත් කිරීමේදි ප්‍රශ්නාවලි, ආකල්ප පරිමාණ, සම්මුඛ සාකච්ඡා හා පන්ති කාමර නිරක්ෂණ

මගින් ලබාගත් දත්ත වෙනම ඉදිරිපත් කර විශ්ලේෂණය කර ඇත. දත්ත විශ්ලේෂණය සඳහා යොදාගත් ගණිතමය සංකල්ප, උපකල්පන වෙන වෙනම දක්වමින් දත්ත විශ්ලේෂණය කර ඇත.

පස්වන හෙවත් අවසාන පරිච්ඡේදය යටතේ අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස එළඹිය හැකි නිගමනද විෂයමාලාව මගින් සිසුන් තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් ඇති කිරීම සඳහා ගෙන ඇති යෝජනා ඉදිරිපත් කරමින් පර්යේෂණ වාර්තාව නිම කර ඇත.